චක්‍රලේඛ අංක -56/2006

මගේ අංකය:- දපස/නීති/චක්‍ර
දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව,
අංක 07, බාලදක්ෂ මාවත, ගාල්ල.
2006.08.07

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල,
සභාපතිවරුන් වෙත.

## සමුපකාර සේවයේ නියුක්ත උපාධිධාරීන් සඳහා අතිරේක දීමනාවක් ගෙවීම.

දකුණු පළාතේ සමුපකාර සමිතිවල සේවයේ නියුක්ත උපාධිය සුදුසුකමක් ලෙස බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන්ව නොමැති විවිධ තනතුරු දරණ උපාධිධාරීන් එකී තනතුරුවල රඳවා ගැනීමේ අපහසුතාවය පිළිබඳව සැලකිල්ලට ගත් කොමිෂන් සභාව, 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව, මසකට රු.1500/= ක අතිරේක දීමනාවක් උපාධිය ලබා ඇති සේවක/සේවිකාවන්ට ගෙවීමට තීරණය කර ඇත.

02. I. බඳවා ගැනීමේ පරිපාටියෙහි උපාධිය සුදුසුකමක් ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කර නොමැති තනතුරක සේවය කිරීම.

II. මෙම දීමනාව ලබා ගන්නා උපාධිධාරීන් අවම වශයෙන් වසර (2) දෙකක් සමිතියේ සේවය කරන බවට ගිවිසුමකට එළඹීම සහ එක් මසක කාලයක දැනුම් දීමකින් තොරව සේවයෙන් ඉවත් වන්නේ නම්, නියමිත නියමයන්ට අමතරව මෙම මාසික දීමනා වද, සමිතියට ගෙවිය යුතු වීම.

III. කොමිෂන් සභාව විසින් උපාධිධාරීන්ට නව වැටුප් ක්‍රමයක් අනුමත කිරීමෙන් අනතුරුව මෙම දීමනාව ගෙවීම අත්හිටුවීම.

IV. සමිතියේ තනතුරකට පත් කිරීම කොමිෂන් සභාව විසින් අනුමත කර තිබීම.

03. මෙම දීමනාව, සමුපකාර සමිතියක සේවය කරමින්, සිටියදී පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත්වන සේවක/සේවිකාවන්ටද, ඉහත අංක I සිට IV දක්වා කොන්දේසිවලට යටත්ව උපාධි සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසුව උපාධිය සමත්වූ දිනයේ සිට ගෙවිය යුතුය.

04. මෙම චක්‍රලේඛණය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

05. මෙම චක්‍රලේඛණයේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කරන ලෙස කොමිෂන් සභාවේ නියෝගය පරිදි දන්වා සිටිමි.

(පී.එල්.වර්නන් පෙරේරා),
වැ.බ.ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත්:-1. ලේකම්, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය.
2. ස.සං.කො/රෙ - ද.ප.
3. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු.